සමාජ සේවා දෙපාර්තමේන්තුව
சமூக சேவைகள் திணைக்களம்
# DEPARTMENT OF SOCIAL SERVICES
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
**Ministry of Rural Development, Social Security and Community Empowerment**

සමාජ සේවා
சமூக சேவைகள் திணைக்களம்
Department of Social Services

STUDENT ...
24 JUN 2025
Rajarata University

"2030 වන විට ආන්තිකකරණයට හා අවාසිසහගත තත්ත්වයන්ට පත් ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සමානාත්මතාවය සපිරි සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ පුරෝගාමියා"
"2030 ஆம் ஆண்டளவில் ஓரங்கட்டப்பட்ட மற்றும் பின்தள்ளப்பட்ட சமுதாயத்தின் உரிமைகள் மற்றும் சமத்துவம் நிரம்பப் பெற்ற பாதுகாப்பான இலங்கையொன்றை உருவாக்குவதில் முன்னோடியாக விளங்குதல்"
"To be the forerunner of the creation of a secured Sri Lanka with marginalized & disadvantaged People whose equality and rights to be protected by 2030"

මගේ අංකය / உமது இல. / My No: MSS/VHTF/17
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.06.04

AR/BS, check & give details if any
23/06

RAJARATA UNIVERSITY MIHINTALE
23 JUN 2025
REGISTRAR'S OFFICE

(18)

ලේඛකාධිකාරි
රජරට විශ්ව විද්‍යාලය
මිහින්තලේ

<u>දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින් සඳහා තාක්ෂණික උපකරණ ලබා දීම</u>

සමාජ සේවා දෙපාර්තමේන්තුව තුළ පිහිටි දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල මගින් වාර්ෂිකව විශ්වවිද්‍යාල පළමු වසර අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින්ගේ අධ්‍යාපන කටයුතු පහසු කර ගැනීම සඳහා තාක්ෂණික උපකරණ පිරිනමනු ලබයි.

02. මේ සඳහා E 10 වර්ගයේ ඩේසි රෙකෝඩරයක් හෝ එම උපකරණයෙන් ලබාගත හැකි පහසුකමට සමාන පහසුකමක් සපයන වෙනත් තාක්ෂණික මෙවලමක් ලබා දීම සිදුකරනු ලබයි.

03 ඒ අනුව මේ වන විට ඩේසි රෙකෝඩරයක් හෝ එමගින් සැපයෙන පහසුකම් සලසා ගත හැකි වෙනත් තාක්ෂණික මෙවලමක් නොමැති විශ්වවිද්‍යාල ප්‍රථම වර්ෂයේ අධ්‍යාපනය හදාරනු ලබන අඩු ආදායම්ලාභී දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නාම ලේඛනයක් පහත සඳහන් ආකෘතිය මගින් කඩිනමින් අප වෙත ලබා දීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

| ශිෂ්‍යයාගේ /ශිෂ්‍යාවගේ නම | පෞද්ගලික ලිපිනය | ජා.හැ.අං. | දු.ක අංකය | ශිෂ්‍ය අංකය | දෘශ්‍යාබාධිත භාවය (B1,B2,B3) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

04. අඩු ආදායම්ලාභී යන්නෙන් අස්වැසුම ලබාදීමේදී සලකා බලනු ලබන ආදායම් සීමාව සලකනු ලබන අතර එය වර්තමානයේදී රු.16,191.00 ක් වේ. (පවුලේ මුළු ආදායම සාමාජික සංඛ්‍යාවෙන් බෙදීමෙන් ලැබෙන වටිනාකම රු.16,191 .00 ට අඩු නම් එම පවුල් ඒකකය අඩු ආදායම්ලාභී පවුල් ඒකකයක් වේ)

02 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල. 02 ஆம் மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமுல்லை. 02nd Floor, Stage II, Sethsiripaya, Battaramulla.

කාර්යාලය / அலுவலகம் / Office: 011 2187050, 011 2187049
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2186276, 011 2186010
ඊ-මේල් / மின்னஞ்சல் / E-Mail: director@socialservices.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.socialservices.gov.lk
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director: 0112187040
අතිරේක අධ්‍යක්ෂ / மேலதிக பணிப்பாளர் / Additional Director: 0112186279
ප්‍රධාන ගණකාධිකාරි / பிரதம கணக்காளர் / Chief Accountant: 0112187059
සහකාර අධ්‍යක්ෂ / உதவிப் பணிப்பாளர் / Assistant Director: 0112187053, 0112186180, 0112187042

Scanned with CamScanner

05. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකන අතර මෙම නාමලේඛනය සඳහා දෘශ්‍යාබාධිත සිසුන්ගේ නම් පමණක් ඇතුළත් කරන මෙන් වැඩි දුරටත් සඳහන් කරමි.

දූර්ශනී කරුණාරත්න

සමාජ සේවා අධ්‍යක්ෂ

Scanned with CamScanner